ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය
நிர்மாணக் கைத்தொழில் அபிவிருத்தி அதிகாரசபை
CONSTRUCTION INDUSTRY DEVELOPMENT AUTHORITY
නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
வீடமைப்பு, நிர்மாணத்துறை மற்றும் கலாசார அலுவல்கள் அமைச்சு
MINISTRY OF HOUSING, CONSTRUCTION & CULTURAL AFFAIRS

| මගේ අංකය / எனது இல / My No. | 1/7/3/3/2 | ඔබේ අංකය / உமது இல / Your No. | | දිනය / திகதி / Date | 2019.05.31 |
|---|---|---|---|---|---|

මහත්මයාණෙනි/මහත්මියනි,

**ඉදිකිරීම් ක්ෂේත්‍රයේ නියැලෙන කොන්ත්‍රාත්කරුවන් හා නිලධාරීන් සඳහා පුහුණු වැඩමුළුව**

ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ මානව ප්‍රාග්ධන සංවර්ධනය ඉලක්ක කරමින් ඉදිකිරීම් සංවර්ධන අධිකාරිය (CIDA) මෙතෙක් අගනුවර ආශ්‍රිතව සිදුකරනු ලැබූ පුහුණු පාඨමාලා ඔබගේ පහසුව උදෙසා දිස්ත්‍රික් මට්ටමින් පැවැත්වීමට කටයුතු සම්පාදනය කර ඇත.

**ඉදිකිරීම් කොන්ත්‍රාත් කළමනාකරනයේදී අතිශ්‍ය වැදගත් වන "ටෙන්ඩර් පත්‍ර පිළියෙල කිරීම හා ලංසු පත්‍ර තාක්ෂණික ඇගයීම" (Preparation of Bid Documents & Evaluation of Bids) පිළිබඳ වැඩමුළුව 2019.06.22 දින පෙ.ව. 8.00 සිට ප.ව. 4.00 දක්වා කෑගල්ල දිස්ත්‍රික් තැපැල් කාර්යාලීය ශ්‍රවණාගාරයේදී පැවැත්වීමට කටයුතු සුදානම් කර ඇත.**

මෙම වැඩමුළුවට සහභාගීවන්නන් සඳහා න්‍යායාත්මක දැනුම ප්‍රායෝගිකව යෙදවීම පිළිබඳ අවබෝධය ලබාදීම අපේක්ෂා කරන අතර CIDA (ICTAD) කොන්ත්‍රාත් ලියාපදිංචියේදී හා අළුත් කිරීමේදී අවශ්‍ය වන CCD ලකුණු 10 ක් සහභාගීවන්නන් නියෝජනය කරන කොන්ත්‍රාත් ආයතන වෙත (උපරිම ලකුණු 50 කට යටත්ව) පිරිනැමේ.

එක් අයෙකු සඳහා රු.3,000.00 ක මුදලක් "සභාපති, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය" නමට ලංකා බැංකුව ටොරින්ටන් ශාඛාව ගිණුම් අංක 77454975 නමින් තැන්පත් කර එම රිසිට් පත CIDA කෑගල්ල දිස්ත්‍රික් සම්බන්ධීකරන නිලධාරි වෙත ලබා දී හෝ එම නිලධාරී මහත්මිය වෙත ගෙවීම් කර ලබා ගන්නා රිසිට්පත මගින් ඔබගේ සහභාගීත්වය සනාථ කර ගත හැකිය.

**මේ පිළිබඳ වැඩි විස්තර කෑගල්ල දිස්ත්‍රික් CIDA දිස්ත්‍රික් සම්බන්ධීකරන නිලධාරී පී. එච්. ලියනගේ මිය ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, අඹන්පිටිය, ගලිගමුව නගරය, කෑගල්ල දුරකථන අංක 0703597627 ඊමේල් cidadco.kegl@gmail.com මගින් ලබා ගත හැක.**

ස්තූතියි!

මෙයට විශ්වාසී,

වාස්තු විද්‍යාඥ එච්.කේ. බාලචන්ද්‍ර
අධ්‍යක්ෂ ජනරාල්
ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය